## නිදහසක් නැති නිදහස

පෙබරවාරි 4 නිදහස් උත්සවය ගැන අමුතුවෙන් ලියන්න දෙයක් ඉතිරි වෙලා නැහැනෙ තවත්. දැන් අවුරුදු 70 ක් තිස්සෙ ඕකේ නිදාන කතාව එහෙට මෙහෙට කර කර ලියනවා අපේ කට්ටිය. වෙන එකම දේ ඕකට අලුතින් මොකක් හරි සෙට් වෙන එක. නැත්නම් තියෙන එකක් හැලෙනවා. එක අතකට එහෙම නොවී ඉදිවීයට යන්නත් බැහැ. එහෙම නැතිවුණොත් එක තැන පල්වෙන්නයි වෙන්නෙ. මේකත් ඉතින් සංස්කෘතික කාරනාවක් නිසා වෙනස් වීමේ බලපෑම වැඩියි. දැන් ඉතින් හැමෝම දන්න කාරණාවක් අපිත් කියලා දමලා අපේ ඇම්මත් පිට කරලා දාමු.

පහුගිය දවස් ටිකේ හැමෝගෙම කතාව ලැප්ටොප් එකයි දුරේක්ෂයයි නිදහස් නැටුම්



වලට එකතු වෙච්ච එකනෙ. මිනිස්සු අලුත් දේවල් කරන්න ඕනෙ තමයි. විශේෂයෙන් මේ වගේ රාජ්‍ය උත්සවයකදි විදේශ අමුත්තෝ ඉස්සරහ සෙල්ලම් දාද්දි. හැබැයි ඉතින් මේ වගේ උත්සවයක් රටම නියෝජනය කරන නිසා ඒක නිර්මාණාත්මක දෙයක් වෙන්නත් ඕනෙ කියලා ආයි අමුතුවෙන් කියන්ත් ඕනෙද? හොඳ වෙලාවට මේ අංග දෙක පෙළපාලියට ඇතුල් කළේ නැත්තෙ. බැරිවෙලාවත් ඇතුල් වුනා නම් ආව අමුත්තන්ට අපේ දැක්ම ගැන නියම තක්සේරුවකට එන්න තිබුණා. මේ වගේ ගොන් පාට් එකක් කොහේ හරි ඈත පළාතක පොඩි පෙරහැරක වුණා නම් අපට ගාණක් නැහැ. නොදන්නා කමට කියලා හිත හදාගන්න ඇහැකි. ඒත් රටේ අනාගත පරම්පරාවට මග පෙන්වන්න යන්න ඉන්න සෙට් එකක් නෙ ගේමට බැහැලා හිටියෙ. එඩ්වඩ් කුමාරයා මේක දැක්කා නම් 48 දි හරි මුන්ගෙන් නිදහස් වුණ එක ගැන මාර විදිහට සතුටු වේවි.

හැබැයි මේ සියල්ල අතරේ අපට සතුටුවෙන්න තියෙන වැදගත්ම කාරණාව තමයි රාජ්‍ය තීරණ වෙනස් කරන්න තරම බලපෑම්ක් සමාජ ජාල වලට ලැබී තිබීම. මේ බලපෑම සාධණීය පැත්තට විතරක් යොදවා ගන්න එක සමාජ ජාල භාවිතා කරන අයගෙ වගකීමක්. මං අදහස් කරන්නෙ තමන්ගෙ ශක්තිය නිසි කාරණා වලට පමණක් යොදවා ගැනීම. එහෙම නොවුණොත් අර තමන්ගෙ බලය ගණිකා සේවයට යොදවාගෙන තියෙන ගොමා සංගමේට වෙච්ච දේ සමාජ ජාලා වලටත් වෙන්ඩ පුලුවන්.

ජයවේවා අන්තර්ජාලයට.

## බංගලියන්ටත් ගැහුවා අපි

බංගලියන්ට ගහලා කප් එක උස්සපු එක ගැන අපේ ක්‍රිකට් ලෝලයන් විඳින සතුට දැක්කම අනේද කියලා චූටි මල්ලිට හිතුණා. යකෝ බංගලියන්ට ගහලා මේ තරම් උඩ පනින තත්වෙට අපේ ක්‍රිකට් වැටුණා නේද කියලයි මට හැම තිස්සෙම හිතුණෙ. මේ යන විදිහට සිම්බාබ්වේටයි ඇෆ්ගනිස්තානෙටයි පිට පිට ගැහුවොත් ජේ ආර් ලොක්කා දුන්නා වගේ නිවාඩුවකුත් හම්බුවෙන්න ඉඩ තියෙනවා. මල්ලිලා අපට සතුටු

# සතිය වංගුව

වෙන්න නම් තව ගොඩක් දුර යන්න තියෙනවා. දැක්කනේ කප් එක මිස් වුනාට ෆස්ට් ටෙස්ට් එකේ බංගලියන්ගෙ රිටර්න් එක. ඒකේ තේරුම උන් දක්ෂයි කියනවට වඩා අපි වීක් කියන එක. පොඩි වෙනසක් වෙලා තියෙනවා තමයි. ඒක හරියටම බලාගන්න පුලුවන් හෙට අනිද්දා නිදහස් කුසලානෙට අපි ඉන්දියාවත් එක්ක සෙට් වෙන ගේමෙදි. අපේ එවුන් හදන්න හරි අමාරුයි කෙවිටක් නැතුව. රටම ඒ වගේ වෙනකොට ක්‍රිකට් විතරක් බේරිලා තියෙයිද? උදාහරණයකට ගන්නකො අර ෆස්ට් ටෙස්ට් එකේ කුසල් මෙන්ඩිස් ලකුණු 196 ක් ගහලා තියෙද්දි හෙමින් සැරේ 200 ට යන්න තියෙද්දි පැනල ගහපු ගොන් ෂොට් එක. මුන්ට ඔලුවක් නෑ කියලා පැහැදිලිව පෙන්නන්න



පුලුවන් උදාහරණයක් තමයි ඒක. අපේ ක්‍රීඩකයන්ගේ ක්‍රිකට් තියෙන්නෙ ඇගේ විතරයි. ඔලුවෙ නැහැ. උන්ට බැහැ මේක මයින්ඩ් ගේමක් කියලා තේරුම් ගන්න. ඉස්සර අපට හිටිය ඔලුවෙන් ක්‍රිකට් ගැහුව කණ්ඩායම නැවත ගොඩ නගන්න හතුරුට කාලයක් යයි. කඹ ගණන් පිරිත් නූල් බඳින එවුනුයි බෝලෙන් බෝලෙට කුරුස ගහන එවුනුයි වෙනුවට තමන්ගෙ ශක්තියෙන් තමන්ගෙ ඔලුවෙන් ක්‍රිකට් ගහන කණ්ඩායමක් හදන්න හතුරුසිංහට පුලුවන් වෙනකල් තමයි චූටි මල්ලි බලන් ඉන්නෙ.  ඔහොම යං..

## අපේ ආදරවන්තයෝ

අපේ ලංකාවෙත් දැන් පෙබරවාරි 14 ආදරවන්තයන්ගෙ දිනේ බොහොම ජයට සමරණවනෙ. ආදරවන්තයන් කෙසේ වෙතත් බිස්නස් කරන සෙට් එක නම් වැඩේ අගේට කරනවා. අපේ කොල්ලෝ කෙල්ලෝ සෙට් එකත් ලස්සනට උන්ගෙ ලණුව ගිලිනවා. එදාට රෝස මල්ද කාඩ්ද තෑගිද ඕසෙට විකිණෙනවා. ආරංචි හැටියට නම් එදාට ආදරවන්තියන් අපේ කාලෙ නම් හීනෙකින්වත් දෙන්න නොහිතපු තවත් නොයෙක් දේ තම තමන්ගෙ ආදරවන්තයන්ට ලෝබ නැතුව දෙනවා. ආදරේ ඒ තරම්. ඒත් දවස් කීපයකට පස්සෙ පත්තර අරන් බැලුවොත් හැම තැනම ආදරය නිසා දිවි නසාගැනීම්. මිනී මරා ගැනීම්. පිහි ඇනුම්. සමූහ දූෂන. ඒක එහෙම වෙන්නෙ කොහොමද? ආදරය කියලා අපේ අලූත් පරම්පරාව අඳුනගෙන තියෙන්නෙ වෙන මොකක් හරි දෙයක් කියලයි චූටි මල්ලිට හිතෙන්නෙ. නැත්නම් දවස් 365 න් වැඩි කාලයක්ම බණ අහන කියන රටක කොල්න්ට කෙල්ලන්ට මෙහෙම වෙන්නෙ කොහොමද? මෙතන මොකක් හරි මිඩසක් තියනවා කියලයි මට නම් හිතෙන්නෙ. මේ අපි අර අහලා තියෙන ආදරය හා වෛරය අතර කෙස්



ගහක දුර ගව්වක් කරගන්න අපට මේ ආදරවන්තෙයන්ගෙ දිනේ යොදාගන්න බැරිද? වෙවාරන්න විච්චූරණ නැතුව අපේ ආදරවන්තයන්ගෙ හිස් කුහර වල ඇති කලින් කියපු අඩුව පුරවන්න මේ දිනය යොදාගන්න වැඩ පිලිවෙලක් අත්‍යවශ්‍ය බව පාලකයන්ට වැටහෙන දිනය ඉක්මණට ලගාවෙන්නය කියලා චූටි මල්ලි ප්‍රාර්ථනා කරනවා.

## සතියේ එක්ස්පර්ට්ස්ලා

ලංකාවෙ ඉඳන් විවිධ කාර්යයන්ට එහෙමත් නැත්නම් නිවාඩු වලට මෙහෙට එන අපේ නෑදෑ හිතවතුන් මෙහිදි අත්දකින දේ ගැන




විවිධ මත පළකරන හැටි අපට දකින්න පුලුවන්. සමහර අය ඒව පත්තර වලටත් ලියනවා. ඒත් තමන් මෙහි ගතකරන කෙටි කාලෙදි අත්දැක්ක විදිහට අසත්‍ය ලියන එක නම් වැරදි වැඩක් කියල කියන්නම වෙනවා. මෙහෙම ලියන්න හිතුවෙ පහුගිය දවසක ලංකාවෙ සතිපතා පත්තරේකට කෙනෙක් කියලා තිබ්බ ලිපියක් දැක්කමයි. ඔහු මෙහෙ ආව වෙලාවෙ දැක්ක අත්දැක්ක දේ හැටියට ලියලා තියෙන අමු පට්ටපල් කෙබර ලංකාවෙ මිනිස්සු කියවද්දි උන්ට මොනවා හිතෙන්න ඇද්ද? ඒ මහත්තය කියල තියෙන විදිහට සමලිංගික අයිතිවාසිකම් පනතෙන් පස්සෙ සමස්ථ ඔස්ට්‍රේලියාවම විනාශ වෙලා ගිහින්ලු. අම්මපා එහෙම එකක් වෙලා තියෙන්නෙ ඔස්ටේලියාවෙ කොතැනද කියලා චූටි මල්ල තාම හොයනවා.. තමන්ට දිරවාගන්න බැරි දේ ගැන මෙහෙම දේවල් ලියන එක පුදුමයක් නෙවෙයි. සමාජයෙ අදහස් කියන්නෙ තමන්ගෙ අදහස් වත් තමන් මෙහෙ ඇවිත් තාවකාලිකව පදිංචිවෙලා ඉන්න ගෙදර මිනිස්සුන්නෙ අදහස් වත් නෙවෙයි කියලා මේ වගේ දේ ලියන අයට මතක් කර දෙන්න කැමතියි. විවිධාකාර ගති පැවතුම් ඇති විවාධාකාර අදහස් දරන විවිධාකාර මිනිසුන් ගැහුනුන් සතුටින් ජීවත්වන මේ සුන්දර සමාජයට අපහාස කරන්න එපා මහත්වරුණි.

## පතිරාජ - ඔබ සුවඳ මලකි

පතිරාජ මහත්තයත් යන්නම ගියා. සමාජයේ අපට දැනෙන හිඩැසක් ඇති කරලා. මහත්මයෙක් ලෙස ජීවත් වී මහත්මයෙක් ලෙසම සමුගත්තා. ඒ සමුගැනීමත් ඔහු ජීවිත කාලය පුරා ගතකළ අල්පේච්ඡ ජීවන රටාවට සමානයි. බොරු දර්ශන නැතුව මිනිස්සුන්ට හිතවතුන්ට කරදර නොකර මිනිස් ශ්‍රම කාලය පැය සිය ගණනක් ඉතිරි කරමින් ඉක්මණින්ම ගියා. මිය ගියාට පසුව



ඔහු ගැන කතන්නර එහෙයි මෙහෙයි ගොඩයි. ඔහුගේ නිර්මාණ කලා ජීවිතය කලාවේ ප්‍රගමණයට ඔහුගේ දායකත්වය වගේ බර සාර විග්‍රහ ගොඩයි.

ලංකාවේදී නෙවෙයි මෙහෙදී අපේ මිනිස්සු ඔහුගේ මානව දයාවට විසංවාදී ගුණයට අනෙකාට ගරු කිරීමේ ප්‍රතිපත්තියට කලකට පෙර සැළකූ හැටි මතක් වෙනකොට දැනෙන්නෙ වචන වලින් ලියන්න බැරි අපුලක්. ඔහු සහෝදර ද්‍රවිඩ ජනතාව වෙනුවෙන් දැක්වූ වූ දයාව වෙනුවෙන් ඔහුට මෙල්බනයෙදි ගෙවන්න වුණේ විශාල වන්දියක්. මානව දයාව ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ඉහළින්ම විඳින රටක ජීවත් වෙමින්ම අපේම මිනිස්සු ඔහුට සැළකූ පහත් ආකාරය අපට නම් අමතක වෙන්නෙ නැහැ. පතිරාජට අසූචි පහර එල්ල කළ ඊනියා දේශප්‍රේමීන් තමන්ගේ ඇඟේම ගා ගත්ත ඒ අශූචි ගඳ අදත් දස අතේ පතුරද්දි පතිරාජ සුදු නෙලුමක් සේ මහා සුගන්ධයක් මේ සමාජයේ ඉතිරි කරලා යන්න ගියා.

චූටි මල්ලි